# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 3 දරන පොලිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 පෙබරවාරි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

(1974 මාර්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 3 දරන පොලිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 පෙබරවාරි මස 19 වන දින]

එල්.ඩී.—ඕ. 24/72.

පොලිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 3 දරන පොලිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු 'ප්‍රධාන ප්‍රඥප්තිය' යනුවෙන් සඳහන් කෙරෙන) පොලිස් ආඥාපනතේ 24, 25 සහ 26 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්ති ආදේශ කරනු ලැබේ :— — 53 වන අධිකාරයේ 24, 25 සහ 26 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

"පොලිස් උප සේවයක් පිහිටුවීම.

24. පොලිස් හමුදාවේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කාර්ය ඉටු කිරීමෙහි ලා පොලිස් හමුදාවට සහාය වීම පිණිස පොලිස් උපසේවයක් පිහිටුවනු ලැබේ.

අණදෙන නිලධරයා සහ නියෝජ්‍ය අණදෙන නිලධරයා පත් කිරීම.

25. (1) මේ ආඥාපනතේ කාර්යයන් සඳහා අණදෙන නිලධරයකු පත් කළ යුතුය. අණදෙන නිලධරයා පොලිස් උපසේවයේ අණ දීමේ කාර්ය භාරය උසුලමින් මේ ආඥාපනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග අනුව පොලිස් උප සේවයේ සාමාන්‍ය පරිපාලනය ගැන වගකිව යුතුය.

(2) තනතුරින් පොලිස් අධිකාරීට වඩා පහත් නො වූ පොලිස් හමුදාවේ නිලධරයකු නියෝජ්‍ය අණ දෙන නිලධරයා වශයෙන් පත් කළ යුතුය. අණ දෙන නිලධරයා පැමිණ නොමැති විටෙක ඔහු සතු සියලු බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය ඉටු කිරීම ද නියෝජ්‍ය අණදෙන නිලධරයා විසින් කළ යුතුය.

උපසේවා නියුක්තයන් බඳවා ගැනීම.

26. (1) පොලිස්පති විසින් නිශ්චය කළහැකි සංඛ්‍යාවක් උපසේවා අධිකාරීන්, සහකාර උපසේවා අධිකාරීන්, ප්‍රධාන උපසේවා පරීක්ෂකයන්, උප සේවා පරීක්ෂකයන්, සහකාර උපසේවා පරීක්ෂක යන්, ප්‍රධාන උපසේවා සැරයන්වරුන්, උපසේවා සැරයන්වරුන් හා උපසේවා කොස්තාපල්වරුන් පත් කිරීම, ඒ සඳහා සාදනු ලබන නියෝග අනුව, අණ දෙන නිලධරයා විසින් කළ යුතුය.

2—ඒ 03336—10,504 (73/12)

(2) උපසේවා අධිකාරී තනතුරට හා සහකාර උපසේවා අධිකාරී තනතුරට කෙරෙන සෑම පත් කිරීමක් ම පොලිස්පතිගේ ලිඛිත අනුමතිය කලින් ලබාගෙන කළ යුතුය.".

26අ, 26ආ, 26ඇ, 26ඈ, 26ඉ, 26ඊ, 26උ සහ 26ඌ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි අන්තර් ගත කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්ති මෙයින් අන්තර්ගත කරනු ලබන අතර ඒවා එහි 26අ, 26ආ, 26ඇ, 26ඈ, 26ඉ, 26ඊ, 26උ සහ 26ඌ වන වගන්ති ලෙස බලපවත්වන්නේ ය:—

"හැඳුනුම් පත්.

26අ. අණදෙන නිලධරයා විසින් සැබෑ බවට විධිමත් ලෙස සහතික කොට යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද හැඳුනුම් පතක් ඒ තැනැත්තා ඒ හැඳුනුම් පතෙහි දක්වෙන පොලිස් උපසේවයේ තනතුරට මේ ආඥාපනත යටතේ පත් කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

සේවයට කැඳවීම.

26ආ. (1) පොලිස් හමුදාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටුකිරීමේ දී පොලිස් හමුදාවට සහාය වීම පිණිස අවශ්‍ය පොලිස් උපසේවා නිලධරයන් සේවයට කැඳවීම පොලිස් පතිගේ විධානය අනුව අණදෙන නිලධරයා විසින් කළ යුතුය. එසේ කැඳවනු ලැබූ කිසිම නිලධරයකු පොලිස්පතිගේ විධානය අනුව මිස අණදෙන නිලධරයා විසින් විසුරුවා නොහැරිය යුතුය.

(2) සේවයට කැඳවීමේ නිවේදනය කට වචන යෙන් හෝ ලියවිල්ලකින් හෝ ගුවන් විදුලිය මගින් කෙරෙන නිවේදනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍රයක පළ කෙරෙන දැන්වීමකින් පොලිස් උප සේවයේ යම් සාමාජිකයකු වෙත දැන්විය හැකිය.

නිලධරයන් ජනරජයේ ඕනෑම ප්‍රදේශ යක සේවය කළයුතු බව.

26ඇ. ජනරජයේ ඕනෑම ප්‍රදේශයක හා එහි දේශීය ජල තීරය ඇතුළත සේවය කරන ලෙස පොලිස් උපසේවයේ නිලධරයකුට නියම කළ හැකිය.

නිලධරයන් සතු බලතල, වගකීම් ආදිය.

26ඈ. පොලිස් උපසේවයේ යම් තනතුරක් දරන නිලධරයකු එසේ සේවයට කැඳවනු ලැබූ කල්හි, ඒ නිලධරයාට, පොලිස් හමුදාවේ එම තනතුර දරන නිලධරයකු සතු බලතල, කාර්ය, බැඳීම් හා වගකීම් ම සහ එම තනතුර දරන නිලධරයකු භුක්ති විඳින මුක්තීන් ම හිමි වන්නේ ය.

සේවයට කැඳවනු ලැබූ විට සේවය ප්‍රතික්ෂේප කළහොත් දණ්ඩනය.

26ඉ. (1) සේවයට කැඳවනු ලැබ සාධාරණ හේතුවක් නොමැතිව සේවය සඳහා පැමිණීම පැහැර හරින හෝ ඒ තත්ත්වයෙන් සේවය කිරීම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන පොලිස් උපසේවයේ යම් නිලධරයකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම ඔහු යටත් වන්නේ ය.

(2) සේවයට කැඳවනු ලැබ තම කාර්ය ඉටු කිරීම සඳහා අණදෙන නිලධරයා විසින් හෝ අණ දෙන නිලධරයා විසින් යථා පරිදි බලය පවරනු ලැබූ පොලිස් උපසේවයේ නිලධරයකු විසින් හෝ පොලිස්පති විසින් යථා පරිදි බලය පවරනු ලැබූ පොලිස් හමුදාවේ නිලධරයකු විසින් කරන ලද නීත්‍යනුකූල නියමයක්, දෙන ලද උපදෙසක් හෝ කරන ලද විධානයක් පිළිපැදීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින පොලිස් උපසේවයේ යම් නිලධරයකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ තුන් මසකට නොවැඩි කාලයක් වැඩ නැතිව බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම ඔහු යටත් වන්නේ ය.

සේවා යෝජකයන්ගේ බැඳීම.

26ඊ. (1) තමන් යටතේ සේවයෙහි නිරතව සිටින යම් තැනැත්තකුට පොලිස් උපසේවයේ සාමාජිකයකු වීම පිණිස හෝ සාමාජිකයකු වී සිටීම පිණිසත් ඒ උපසේවයේ සාමාජිකයකු වූ එබඳු යම් තැනැත්තකුට මේ ආඥාපනතින් හෝ ඒ යටතේ නියම කළ හැකි පුහුණුව ලැබීම හා සේවය ඉටු කිරීම පිණිසත් නිසි පහසුකම් සියල්ල සැලැස්වීම සෑම සේවා යෝජකයකුගේ ම කාර්යය වන්නේ ය.

(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් පහසුකම් සැලැස්වීමට අපොහොසත් වන; නැතහොත්

(ආ) ඒ උපවගන්තියේ සඳහන් යම් පුහුණුවක් ලැබීම හෝ සේවයක් ඉටු කිරීම හේතුකොට ගෙන සේවකයකු සේවයෙන් පහ කිරීමෙන් හෝ

ඔහුගේ පඩි අඩු කිරීමෙන් හෝ වෙන යම් ක්‍රමයකින්, ඔහුට දඬුවම් කරන

යම් සේවායෝජකයකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම යටත් වන්නේය.

(3) මේ වගන්තිය යටතේ වරදක් කරන සේවායෝජකයකු—

(අ) සංස්ථාවක් වූ විට ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු ව සිටි සෑම තැනැත්තකු ම විසින් ; සහ

(ආ) ව්‍යාපාරික ආයතනයක් වූ විට ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම විසින්

තමාගේ අනුමතිය හෝ වරදෙහි නිසොල්මන්වීම නොමැතිව ඒ වරද කර ඇති බවත් ඒ තත්ත්වයෙහි ලා තම කාර්යවල ස්වභාවය හා එළඹ තිබූ සියලු කරුණු ගැන සැලකිලිමත්ව තමා විසින් කළ යුතුව තිබූ පරිදි ඒ වරද වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බවත් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ අධ්‍යක්ෂ, කළමනාකරු, ලේකම් හෝ හවුල්කරු ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතුය.

අනවසරයෙන් නිල ඇඳුම පාවිච්චි කිරීම.

26උ. (අ) සේවයට කැඳවනු ලැබ නොමැති විට හා නීත්‍යානුකූල අවසරය නොමැතිව, පොලිස් උපසේවයේ නිලධරයකුගේ නිල ඇඳුම හෝ එහි යම් කොටසක් නැතහොත් රැවටීමට පිළියෙල කළ එහි යම් අනුකරණයක් පාවිච්චි කරන හෝ අඳින; නැතහොත්

(ආ) නීත්‍යානුකූල අවසරය නොමැතිව, පොලිස් උපසේවයේ නිලධරයකු නොවූ තැනැත්තකු වෙත එබඳු යම් නිල ඇඳුමක් හෝ එහි කොටසක් සපයන

පොලිස් උපසේවයේ යම් නිලධරයකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි

රුපියල් දෙසියයකට නොවැඩි දඩයකට හෝ තුන් මාසයකට නොවැඩි කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම යටත් වන්නේ ය.

රීති සෑදීම.

26ඌ. පොලිස්පති විසින් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව පොලිස් උපසේවයට සම්බන්ධ පහත සඳහන් කරුණු සියල්ල හෝ එයින් යම් කරුණක් වෙනුවෙන් රීති සෑදීම නීත්‍යානුකූල වන්නේය :—

(අ) පොලිස් උපසේවයේ සේවකයන් හා කාර්ය මණ්ඩලය ;

(ආ) නිලධරයන් බඳවා ගැනීම හා ඔවුන්ගේ සේවා කොන්දේසි ;

(ඇ) සේවයට කැඳවනු ලැබූ නිලධරයන්ගේ කාර්ය හා වගකීම් ;

(ඈ) නිලධරයන් පුහුණු කිරීම ;

(ඉ) පොලිස් උපසේවය සන්නද්ධ කිරීම ;

(ඊ) නිලධරයන්ගේ විනය ;

(උ) නිලධරයන් සේවයට කැඳවීම හා විසුරුවා හැරීම ;

(ඌ) විශිෂ්ට සේවය අගය කොට සැලකීමක් වශයෙන් ත්‍යාග හෝ ආභරණ ප්‍රදානය කිරීම ;

(එ) පොලිස් උපසේවා සැප විහරණ අරමුදලක් පිහිටුවා පරිපාලනය කිරීම ; සහ

(ඒ) නිලධරයන් විසින් බලතල ක්‍රියාත්මක කිරීමට හා කාර්ය ඉටු කිරීමට සම්බන්ධ වෙන යම් කරුණක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වන වගන්තිය සංශෝධනය කිරීම.

4. (1962 අංක 15 දරන පනතින් අන්තර්ගත කරනු ලැබ 1972 අංක 3 දරන පනතින් සංශෝධිත) ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) යම් පොලිස් නිලධරයකු තුවාලයක් හේතු කොට ගෙන සදහට ම සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් දුබල වූ අවස්ථාවක නැතහොත් යම් පොලිස් නිලධරයකු තුවාලයක් හේතු කොට ගෙන මියගිය අවස්ථාවක ඒ දුබලතාව හෝ මරණය සිදුවූයේ—

(අ) තම කාර්යයෙහි යෙදී සිටිය දී ; හෝ

(ආ) (i) තම කාර්යය සඳහා තමන් පදිංචි ස්ථානයේ සිට තම කාර්ය ස්ථානය දක්වා ; නැතහොත්

(ii) කාර්යයෙන් පසු තම කාර්ය ස්ථානයේ සිට තමන් පදිංචි ස්ථානය දක්වා

කෙලින්ම ගමනේ යෙදී සිටිය දී ; හෝ

(ඇ) කාර්යයෙහි නොයෙදී සිටිය දී තමා සතු සාමාන්‍ය කාර්ය විෂය ප්‍රමාණය ඇතුළත වූ යම් ක්‍රියාවක් කරද් දී; හෝ

(ඈ) තම කාර්ය ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ; හෝ

(ඉ) තම කාර්ය ඉටු කිරිමේහිලා ඔහු විසින් කරන ලද යම් ක්‍රියාවක් මුල් කොටගත් හෝ ඉන් උද්ගත වූ යම් පළිගැනීමක ප්‍රතිඵලයක් වශයෙන්

සිදු වූ තුවාලයක් නිසා වන කල්හි ඒ පොලිස් නිලධරයාට හෝ ඒ පොලිස් නිලධරයාගේ නීත්‍යනුකූල උරුමක්කාරයාට හෝ උරුමක්කාරයන්ට වන්දි ගෙවීම පිණිස වන්දි යෝජනා ක්‍රමයක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වෙන නියෝග සෑදීම අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කළ හැකිය.

ඒ වන්දි ප්‍රදානය කිරීමේදී අනුගමනය කළ යුතු වූ ද යටත් විය යුතු වූ ද ප්‍රතිපත්ති, ව්‍යතිරේක, සීමා කිරීම් හා කොන්දේසි සඳහාත් ඒ යෝජනා ක්‍රමය පිහිටුවීම සහ ක්‍රියාවේ යෙදවීම පිණිස අවශ්‍ය හෝ යෝග්‍ය සෙසු සියලු ම කරුණු සඳහාත්, ඒ නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකිය. පොලිස් උපසේවයේ සාමාජිකයන් වූ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් හා එබඳු සාමාජිකයන් නොවූ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වෙන වෙන ම විධිවිධාන ඒ නියෝග මගින් සැලැස්විය හැකිය.".